# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1986 අංක 33 දරන ශ්‍රී පූණ්‍යෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 සැප්තැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

**1986 අංක 33 දරන ශ්‍රී පුණ්‍යෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 24 වන දින.]

එල්. ඩී.—ඕ. 55/85

**ශ්‍රී පුණ්‍යෝදය සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී පුණ්‍යෝදය සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක් එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කෑගල්ල, වැවලදෙණිය සිරි මහින්දෝදය පිරිවෙන් විහාරස්ථානයේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1986 අංක 33 දරන ශ්‍රී පුණ්‍යෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී පුණ්‍යෝදය සමිතියේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී පුණ්‍යෝදය සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද එය පාවිච්චි කිරීමට ද තම කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට හා අලුත් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. ශ්‍රී පුණ්‍යෝදය සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා තැනැත්තන් පැවිදි කිරීමට පහසුකම් සැලැස්වීම ;

(ආ) ඒ භික්ෂූන් වහන්සේලාට ධර්මය උගන්වා ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා උන්වහන්සේලා පුහුණු කිරීම ;

(ඇ) අනාථ දරු දැරියන් පුනරුත්ථාපනය කිරීමට උපකාරී වීම ; සහ

(ඈ) දුප්පත් තරුණයන්ට ස්වයං රැකියාවල නිරතවීමට හැකි වන පරිදි වෘත්තීය සහ කාර්මික පුහුණුවක් ලබාදීම.

විධායක කමිටුව.

4. සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව,

(අ) මේ පනතේ උපලේඛනයෙහි සඳහන් තැනැත්තන්ගේ මුළු ජීවිත කාලය තුළදී ඒ තැනැත්තන්ගෙන් ද;

(ආ) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගත යුතු සභාපතිවරයකුගෙන්, ලේකම්වරයකුගෙන් සහ භාණ්ඩාගාරිකවරයකුගෙන් ද;

(ඇ) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගත යුතු සහ එම රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් ද

සමන්විත විධායක කමිටුව විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරමින් සිටි සමිතියේ විධායක කමිටුවේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ ත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කරගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා හෝ ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර ආකාරයේ වූ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද විධායක කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ද සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පත්කර ගැනීම සඳහා ද සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරගනු ලබන යම් රීතියක් හෝ වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම විධායක කමිටුව විසින් අනුමත කරනු ලැබුවහොත් මිස බල නොපැවැත්විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපැවැත් වූ සමිතියේ රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයෙහි බල පවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සමිතිය මගින් ගෙවිය යුතු ණය හා සමිතියට අයවිය යුතු ණය.**

7. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ පවත්නා සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සමිතියට අය විය යුතු සියලු දායක මුදල්, සාමාජික මුදල් සහ ණය මුදල් සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

8. විධායක කාරක සභාවේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී සාමාජිකයන් තිදෙනා පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු අතර, එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීත්‍යනුකූලව සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය. තවද විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ රීති වලට යටත්ව සංස්ථාව විසින් එකී සියලු දේපළ දැරිය යුතු ය.

**ජනරජයේ හා අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් විලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

## උපලේඛනය

[4 වන වගන්තිය]

1. තාඹුගල ශ්‍රී සෝරත නායක හිමි
2 තාඹුගල බුද්ධරක්ඛිත හිමි

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.